**බදුල්ල මහා නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 08 දින දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2 ගනුදෙනු, මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

**පිළිතුරු නොලත් විගණන විමසුම්**

2011 මාර්තු 31 දින වනවිට විගණන විමසුම් 11 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.21,585,329 ක් විය.

#### 1.2.2 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත 267-272 වගන්ති | පනතේ විධිවිධාන ප්‍රකාරව සභාව විසින් අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1988 අංක 56 සහ 2000 අංක 53 දරන ජාතික පාරිසරික පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන පරිසර පනතට අනුව වන සම්පත් හා පාරිසරික අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කළ 2000 නොවැම්බර් 22 දිනැති අංක: 1159/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ “අ” උප ලේඛණය | සභාවේ ගෝඝාතකාගාරය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) | මු.රෙ. 189 | 1999 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලයට අයත් වටිනාකම රු.1,153,434 ක් වූ අගරු වූ චෙක්පත් 89 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මු.රෙ. 371 | 1998 සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 51 කදී විවිධ පාර්ශවයන් වෙත විවිධ කාර්යයන් සඳහා දෙනු ලැබූ රු.3,821,811 ක අත්තිකාරම් මුදල් 2010 වර්ෂය අවසාන වන විටද පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) | මු.රෙ. 395 (ඇ) | මුදල් රෙගුලාසිය ප්‍රකාරව සෑම මසකම බැංකු සැසඳුම් ප්‍රකාශය ඊළඟ මස 15 වැනි දිනට පෙරාතුව පිළියෙල කළ යුතු වුවත්, සභාව විසින් අවසන් වරට බැංකු සැසඳුම් පිළියෙල කර තිබුනේ 2010 සැප්තැම්බර් මස දක්වා පමණි. |
| (iv) | මු.රෙ. 396 | නිකුත් කර මාස 06 ඉක්ම වූ ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ වටිනාකම රු.52,277 ක් වූ චෙක්පත් 25 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (v) | මු.රෙ. 570 හා 571 | තැන්පත් කර වසර 02 ක කාලයක් ඉක්මවා ඇති රු.5,005,986 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (vi) | මු.රෙ.763 | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ගබඩා ව්‍යවස්ථා සකසා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (vii) | මු.රෙ.1645 (අ),(ඇ) සහ මු.රෙ. 1646 | මුදල් රෙගුලාසි ප්‍රකාරව සභාව සතු වාහන වෙනුවෙන් විධිමත්ව ලොග් සටහන් පොත් පවත්වා නොතිබූ අතර, ඇතැම් වාහන සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් සහ ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (viii) | මු.රෙ.1647 (ආ) සහ (ඉ) | මුදල් රෙගුලාසි ප්‍රකාරව සභාව සතු වාහන සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර, වාහන සම්බන්ධ විස්තර ඇතුලත් ලේඛණයක් පවත්වා නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය
-----------------------------------

| | | |
|---|---|---|
| (i) | xix පරිච්ඡේදයේ 3 වගන්තිය සහ 4:3:4 උප වගන්තිය | නගර සභාවේ නිවාස ලැබීමට සුදුසුකම් ඇති නිලධාරීන් හඳුනාගෙන ඒ අනුව පොරොත්තු ලේඛණ පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | xix පරිච්ඡේදයේ 5 වගන්තිය | නිවාස සඳහා ආර්ථික කුලිය අයකිරීමේ දී ප්‍රධාන තක්සේරුකරු මගින් කුලී තක්සේරු කරවාගෙන ඒ සඳහා අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමතිය ලබාගෙන නොතිබුණි. |

## 2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**
-----------------------------------

### 2.1 **ආදායම් පරිපාලනය**
----------------------

### 2.1.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**
-----------------------------------------------------------------

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ. එසේ වුවද, ඉදිරිපත් කර තිබූ තොරතුරු නිරවද්‍ය නොවන බව නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තු ගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තු ගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු'000 | රු'000 | රු'000 | රු'000 | රු'000 | රු'000 |
| වරිපනම් හා බදු | 48,581 | 19,455 | 29,126 | 63,264 | 12,329 | 50,935 |
| බදු කුලී | 9,931 | 7,019 | 364 | 6,202 | 3,071 | 3,131 |
| බලපත්‍ර ගාස්තු | 6,282 | 3,146 | 2,703 | 5,126 | 3,124 | 2,002 |
| වෙනත් ආදායම් | 267 | 892 | 1,638 | 5,748 | 4,223 | 1,725 |

### 2.1.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.832,592 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.1.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.5,089,826 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.1.4 වරිපනම් බදු

සභාව විසින් ගොඩනැගිලි අයදුම්පත් අනුමත කර තිබුණු ඉදිකිරීම් 1488 ක් පිළිබඳ සොයා බලා අනුකූලතා සහතික ලබාදී, වරිපනම් වටිනාකම් සංශෝධනය කර වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.1.5 විනෝද බදු

1998 සිට 2005 දක්වා කාලයට අදාලව සිනමා ශාලාවකින් අයවිය යුතු රු.1,632,128 ක් සහ තවත් සිනමා ශාලාවකින් 2003 වර්ෂය සඳහා අයවිය යුතු රු.2,812,841 ක විනෝද බදු මුදල්ද 1999 වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු.73,500 ක ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ගාස්තුද අයවී නොතිබුණි.

## 2.2 **අධිභාර**

මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 226 (1) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව, 2010 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාරවල අගය රු.3,540,000 ක් විය.

## 2.3 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| විධායක | 06 | 04 |
| තෘතීය | 39 | 31 |
| ද්විතීයක | 49 | 56 |
| ප්‍රාථමික | 272 | 205 |
| වෙනත් (අනියම්, තාවකාලික) | නැත. | 88 |

## 2.4 **වත්කම් කළමනාකරණය**

### 2.4.1 **නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

මැසි ෆර්ගියුසන් වර්ගයේ ට්‍රැක්ටර් රථ දෙකක් හා කුබෝටා වර්ගයේ අත් ට්‍රැක්ටර් දෙකක් නිශ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

### 2.4.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.14,320,225 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.1,969,308 ක් විය.

### 2.4.3 සමීක්ෂණය නොකළ වත්කම්

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

## 2.5 හඳුනාගත් පාඩු හා හානි

(අ) 2010 වර්ෂයේ සතිපොළ භූමියේ පොළ බදු අයකිරීමේ අයිතිය ටෙන්ඩර් මඟින් බදුගත් තැනැත්තා විසින් පොල බදු අයකිරීමේ දී මතුවූ ගැටළුකාරී තත්ත්වයන් විසඳීමට කටයුතු නොකර සභාවේ ආදායම් පරීක්ෂකවරුන් යොදවා පොල බදු එකතු කිරීම හේතුවෙන් සභාවට රු.1,265,804 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ) නියමිත පරිදි බිල්පත් නොපියවීම හේතුවෙන් විසන්ධි කළ ජල සම්බන්ධතා නැවත සන්ධිකිරීම සඳහා සභා අරමුදලින් රු.13,440 ක් ගෙවා තිබුණි.

(ඇ) සභාවේ සේවකයෙකු වෙනුවෙන් 1991 සිට 1995 දක්වා කාලයට අදාලව සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීම ප්‍රමාදකිරීම හේතුවෙන් සභා අරමුදලින් රු.9,052 ක අධිභාරයක් ගෙවා තිබුණි.

## 2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවන කොටසේ සඳහන් විධිවිධාන සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්ට අනුව නියමිත කාලය තුලදී විනය පරීක්ෂණ කටයුතු නිම නොකිරීම හේතුවෙන් රාජකාරී වැඩ තහනම් කර සිටි නිලධාරියෙකුට වසර 03 මාස 02 දින 10 ක කාලයක් වෙනුවෙන් වැටුප් හා ජීවන වියදම් දීමනා ලෙස රු.1,118,759 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල වීථි පහන් නඩත්තු කිරීම සඳහා සභාව විසින් දරන වියදම් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කර නොතිබූ අතර, සභාව නඩත්තු කරන වීථි පහන් විස්තර සහ දැනට ලංකා විදුලිබල මණ්ඩලය විසින් වීථි පහන් නඩත්තුව සඳහා ගෙවන ගාස්තු අනුව දළ වශයෙන් සභාවට වාර්ෂිකව රු.628,572 ක් පමණ අහිමිවී තිබුණි.

(ඇ) සභා සීමාව තුල පවත්වාගෙන යන අනවසර කේබල් රූපවාහිනී සේවාව විධිමත් කිරීම සඳහා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පැනවීම හෝ වෙනත් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 23 කදී මිලදී ගත් රු.3,168,119 ක් වටිනා භාණ්ඩ, තොග පොත්වලට හෝ බින්කාඩ්පත්වල ඇතුලත් නොකර බෙදාහැර තිබුණු බව නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

## 2.7 කාර්ය සාධනය

සභාවේ ගිණුම් වාර්තා යාවත්කාලීනව ඉදිරිපත් කර නොතිබීමේ හේතුවෙන් සභාවේ කාර්ය සාධනය ඉලක්කගත අරමුණු කරා ළඟා වූයේද, වාර්ෂික ක්‍රියාකාර සැලැස්මට අනුකූලව කටයුතු කළේද යන්න නිගමනය කළ නොහැකි විය.

## 2.8 කොන්ත්‍රාත් පරිපාලනය

2000 - 2005 කාල පරිච්ඡේදය තුළදී සභා අරමුදලෙන් රු.3,679,675 ක් වැය කර ඉදිකර තිබුණ පිහිනුම් තටාකයෙ ඉදිකිරීම්, ප්‍රමිතියට අනුකූල නොවීම නිසා 2005 වර්ෂයේ සිට ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය